# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 243/23 — 1976 දෙසැම්බර් 17 වැනි සිකුරාදා — 1976.12.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : ඩබ්ලිව්. 68(70)/76.

**(40 වන අධිකාරය වූ) මහාජන ආරක්ෂක ආඥපනත**

අගමැතිගේ නිර්දේශය අනුව, මහාජන ආරක්ෂක ආඥපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝග.

වි. ගොපල්ලව,
ජනාධිපතිවරයා.

1976 දෙසැම්බර් මස 17 වන දින,
කොළඹ,
ජනාධිපති කාර්යාලයේ දී ය.

**නියෝග**

1. මේ නියෝග හදිසි අවස්ථා (සමුපකාර අධිකාර) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතෙහි හෝ වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත ද මෙම නියෝග බලපවත්වන්නේ ය.

3. ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන එක් එක් ප්‍රදේශය සඳහා (මෙහි මින් මතු " අධිකාරය " යනුවෙන් සඳහන් කරනු ලබන) සමුපකාර අධිකාරයක් පිහිටුවනු ලබන අතර, එය අමාත්‍ය වරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් පස් දෙනෙකුට නොවැඩි ගණනකින් සමන්විත සංස්ථාවක් වන්නේ ය. අමාත්‍යවරයා විසින් ඒ සාමාජිකයන්ගෙන් කෙනෙකු අධිකාරයේ සභාපති වශයෙන් පත් කරනු ලැබිය යුතු ය.

4. අධිකාරයේ බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ද අධිකාරයේ රැස්වීම් පිළිබඳ ක්‍රියාපටිපාටිය විධිමත් කිරීම, එහි ගණපූරණය සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම සම්බන්ධයෙන් ද සාමාන්‍ය හෝ විශේෂ ලිඛිත විධාන අධිකාරය වෙත අමාත්‍යවරයා විසින් දෙනු ලැබිය හැකි ය. අධිකාරය විසින් ඒ සෑම විධානයක් ම ක්‍රියාත්මක කළ යුතු ය.

5. අධිකාරයට පහත සඳහන් බලතල තිබිය යුතු ය :—

(අ) අධිකාරය පිහිටුවා ඇත්තේ යම් ප්‍රදේශයක් සඳහා ද ඒ ප්‍රදේශය තුළ පිහිටා තිබෙන්නාවූ ද, ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කර ඇත්තාවූ, හෝ ලියාපදිංචි කර ඇතැයි සැල කෙන්නා වූ ද යම් සමුපකාර සමිතියක අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඒ සමිතියේ යම් කාර්යයක්, ඒ සමිතියේ කළමනාකරණය, ඒ සමිතියේ මුදල් ගෙවීම හෝ ඒ සමිතියේ සේවකයන් බඳවා ගැනීම, පත් කිරීම, උසස් කිරීම, මාරු කිරීම සහ ඒ සේවකයන්ගේ සේවය නතර කිරීම සම්බන්ධයෙන් උපදෙස් හෝ විධාන නිකුත් කිරීමට ;

(ආ) එවැනි යම් සමුපකාර සමිතියක දේපළ හෝ ව්‍යාපාරය සම්බන්ධයෙන් වාර්තා, ගිණුම් හෝ වෙනත් තොරතුරු අධිකාරය විසින් තීරණය කරනු ලබන ආකෘතියක, අධිකාරය වෙත සපයන ලෙස ඒ සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත විධාන කිරීමට ;

(ඇ) එවැනි යම් සමිතියක යම් කාර්යයක් කර ගෙන යාම සහ එම කාර්යයෙහි කළමනාකරණය භාර ගැනීම හෝ ඒ කාර්යය කරගෙන යාම සහ එහි කළමනාකරණය සඳහා විකල්ප වැඩ පිළිවෙලක් යෙදීමට ;

(ඈ) එවැනි යම් සමුපකාර සමිතියක අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් සාමාජිකයකු හෝ සියලු සාමාජිකයින් හේතුවක් නොදක්වා ඉවත් කිරීමට සහ ධුරයෙන් ඉවත් කරන ලද යම් සාමාජිකයකු වෙනුවට යම් තැනැත්තකු පත් කිරීමට සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලු සාමාජිකයන් ඉවත් කරන ලද අවස්ථාවක ඒ සමිතියේ කළමනාකරණය සඳහා සුදුසු විකල්ප වැඩ පිළිවෙලක් යෙදීමට ; සහ

(ඉ) යම් සමිතියක් ක්‍රියාත්මක වන ප්‍රදේශ සීමා නැවත නිශ්චය කිරීමට.

6. (1) 5 වන නියෝගය යටතේ යම් උපදෙස් හෝ විධාන නිකුත් කරනු ලබන්නේ යම් සමුපකාර සමිතියක් වෙත ද ඒ උපදෙස් හෝ විධාන අනුව කටයුතු කිරීම එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ යුතුකම වන්නේ ය.

(2) අධිකාරය විසින් 5 වන නියෝගය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබූ, යම් සමුපකාර සමිතියක අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු ඒ ඉවත් කරනු ලැබූ දිනයේ සිට සිය ධුරය අත් හළ යුතු ය.

(3) වෙන යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුවද 5 වන නියෝගය යටතේ අධිකාරය වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමෙහිලා අධිකාරය විසින් හෝ, අධිකාරය විසින් නිකුත් කරන ලද යම් උපදෙසක් හෝ විධානයක් අනුව ක්‍රියා කිරීමේ හෝ යම් උපදෙසක් හෝ විධානයක් ක්‍රියාත්මක කිරීමේ කාර්යයෙහි ලා යම් සමුපකාර සමිතියක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හෝ කරන ලද ක්‍රියාවක් හෝ දෙයක් වලංගු හා බලසහිත වන අතර කිසිම අධිකරණයකදී හෝ විනිශ්චය අධිකාරයකදී එය ප්‍රශ්න නොකළ යුතු ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.